## 1 : 1 හැඳින්වීම

හැත්තෑවේ දශකයේ නාට්‍ය නිර්මාණ දෙස බැලීමේදී ඒවායේ පොදුවේ දැකිය හැකි තේමාවන් වූයේ පංති ගැටුම් දේශපාලනික ගැටුම් කම්කරු සිතුවිලි යනාදියයි. එම යුගයේ නිෂ්පාදිත නාට්‍ය කරුවන්ගේ නිර්මාණ මේ අදහස් සනාථ කරයි. එම චින්තාව සනාථ කරමින් නැගී ආ සමකාලීන නාට්‍ය කරුවන් අතර ප්‍රධනත්වයක් උසුලන ධර්මසිරි බණ්ඩාරනායක කැපීපෙනේ. ඔහුගේ නිර්මාණයන් ප්‍රබලවම එකල දේශපාලනය තේමා කොට ගනිමින් නිර්මාණ ඉදිරිපත්කලා පමණක් නොව එම නිර්මාණවල රංගනයද ඊට උචිත ප්‍රකාශන ප්‍රතිභාවකින් සකස්වී තිබීම එයට හේතු වේ. එය ඔහුගේ නාට්‍ය නිර්මාණවල පමණක් නොව චිත්‍රපට නිර්මාණවලද එකසේ දිස්වේ. ඒ අතරින් ධර්මසිර බණ්ඩාරනායකගේ මකරාක්‍ෂ, ධවල භීෂණ, ඒකා - අධිපති, යක්‍ෂාගමනය, ට්‍රෝජන් කාන්තාවෝ නාට්‍ය නිර්මාණ ප්‍රධානත්වයක් ගනී. විචාරකයන්ගේ නොමද පැසසුමට ලක්වූ ඔහුටම ආවේණික නාට්‍ය ශෛලියක් භාවිතා කරමින් ප්‍රේක්ෂකයන්ගේ බුද්ධියටත් රසවින්දනයටත් ආමන්ත්‍රනය කිරීමට ඔහු තෝරා ගත්තේ වේදිකාවයි. පැවති පාලනය විවේචනය කිරීම භයානක වූ අවධියක ඔහු තම නිර්මාණ මගින් නොබියව සත්‍ය ඉදිරිපත් කලේය. අනෙක් නාට්‍ය කරුවන්ටද එය ආදර්ශයක් විය. ඔහු තුල වූ දඩබ්බර අරගලශීලී තරුණ සිතුවිලි සමඟ ඔහු නාට්‍යයෙන් මූර්තිමත් කලේ එකල පැවති සමාජයයි. මෙම නිර්මාණ තුලින් බොහෝවිට මතු කරනුයේ ජනමතයෙන් තේරී පත්වන ජනතා නියෝජිතයන් අවසානයේ ඒකාධිපති ස්වරූපයක් දරන අයුරුයි. බල අරගලයේ ප්‍රතිපල විඳින කාන්තාව හා දරුවන්ගේ ජීවිත ඉතා සංවේදීව විවරණය කිරීමට ඔහු සමත්වී තිබේ.

එම නිර්මාණයන්ගෙන් ඔහු ඉදිරිපත් කල කාලානුරූපී බව හා දේශපාලනික උපහාසරූපී බව සොයා බැලීම සඳහාත්, ඔහු ලද සාර්ථක බව හා එම නිර්මාණ තුළ වූ සකලවිධ ලක්ෂණ විමසුමට ලක්කිරීම සඳහාත්, ඒ පිළිබඳව අධ්‍යනය කිරීමට මා තුල පවතින ආශාව නිසාත් මෙම කරුණු කාරනා විවිධ ප්‍රවේශයන් ඔස්සේ විමසා බැලීම මගේ මෙම විමර්ශනයේ ඒකායන උත්සාහය වන්නේය.

## 1 : 2 අභිමතාර්ථ

1. ධර්මසිරි බණ්ඩාරනායක නම් නාට්‍යකරුවා හා ඔහුගේ ප්‍රශස්ත නාට්‍ය නිර්මාණ විමසුමට ලක් කිරීම.
2. එකළ සමාජ පසුබිම ඔහු නාට්‍ය තුළින් ඉදිරිපත් කළ විලාශය හඳුනාගැනීමට.
3. ඔහු හා සමකාලීන නිර්මාණ පිළිබඳව සොයා බැලීම හා ඔහුගේ නිර්මාණවල ඇති සුවිශේෂී බව සොයා බැලීම.